රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:59/89 (1)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,කොළඹ 07.
1990 ජනවාරි මස 26 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ
සහ රාජ්‍ය සංස්ථාවල සභාපතිවරුන් වෙත.

## ත්‍රස්තවාදී ක්‍රියාවල නිරතවූ පුද්ගලයින් වෙනුවෙන් වන්දි ඉල්ලීම.

1989.11.30 දිනැති අංක:59/89 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා එයට අනුබද්ධිත චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කෙරේ. ත්‍රස්තවාදී ක්‍රියා හේතුකොටගෙන මියගිය පදනම යටතේ මියගිය ත්‍රස්තවාදීන් වෙනුවෙන් පවා වන්දි ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බැව් අවධානයට ලක්වී ඇත.

02. එබැවින් ත්‍රස්තවාදී ක්‍රියා හේතුකොටගෙන සිදුවූ ආබාධිතවීම් හෝ මරණ පිළිබඳව වන්දි ඉල්ලීම් සලකා බැලීමේදී ත්‍රස්තවාදීන්ට හෝ ත්‍රස්තවාදීන්ගේ යැපෙන්නන්ට හෝ වන්දි නොගෙවන බවට වගබලා ගත යුතුයයි රජය තීරණය කර ඇත.

අ.කළේ/ (පී.එන්. එම්. ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.